**ඒඩ්ස් ක්ෂය රෝගය සහ මැලේරියාව මර්ධනය කිරීම සඳහා වූ ගෝලීය අරමුදල් ව්‍යාපෘතිය නව මූල්‍ය ආකෘතිය යටතේ එච්අයිවී/ඒඩ්ස් සංරචකය - 2018**

-----------------------------------------------------------------------------------------------------------------------

ඒඩ්ස්, ක්ෂය රෝගය සහ මැලේරියාව මර්ධනය කිරීම සඳහා වූ ගෝලීය අරමුදල් ව්‍යාපෘතියේ නව මූල්‍යයන ආකෘතිය යටතේ එච්අයිවී/ඒඩ්ස් සංරචකයේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ඒඩ්ස්, ක්ෂය රෝගය සහ මැලේරියාව මර්දනය කිරීම සඳහා වූ ගෝලීය අරමුදල අතර 2015 නොවැම්බර් 26 දින එළඹි අංක 977-එල්කේඒ-එච්-එම්ඕඑච් දරන ප්‍රදාන ගිවිසුමේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුවට වාර්තා කළ යුතු යැයි මා සලකනු ලබන අදහස් හා නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, මූල්‍යනය හා ව්‍යාපෘතියේ කාලය

-----------------------------------------------------------------------------------

ප්‍රදාන ගිවිසුම ප්‍රකාරව, සෞඛ්‍ය පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ සහ මෙහෙයවීමේ නියෝජිත ආයතනය වේ. ශ්‍රී ලංකාවේ එච්.අයි.වී / ඒඩ්ස් වැළැක්වීම, පාලනය කිරීම සහ ප්‍රතිකාර කිරීම සඳහා වන ජාතික වැඩසටහන් ක්‍රියාකාරකම් පුළුල් කිරීම ව්‍යාපෘතියේ අරමුණු වේ. ව්‍යාපෘති ක්‍රියාකාරකම් එච්අයිවී නව මූල්‍යනය ආකෘතිය නමින් එච්අයිවී/ඒඩ්ස් නව සංරචකය යටතේ ක්‍රියාත්මක වේ. ප්‍රදාන ගිවිසුම ප්‍රකාරව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තු ගත මුළු පිරිවැය රු.මිලියන 1,033.99 කට සමාන එක්සත් ජනපද ඩොලර් මිලියන 7.91 ක් වන අතර එය ඒඩ්ස්, ක්ෂය රෝගය සහ මැලේරියාව පිළිබඳ ගෝලීය අරමුදල විසින් මූල්‍යයනය කිරීමට එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2016 ජනවාරි 01 දින ආරම්භ කර තිබුණු අතර 2018 දෙසැම්බර් 31 වන විට අවසන් කිරීමට යෝජිතව තිබුණි. කෙසේ වුවද, ව්‍යාපෘතියේ කටයුතු අවසන් කිරීමේ දිනය 2021 දෙසැම්බර් 31 දින දක්වා දීර්ඝ කර තිබුණි.

## 1.3 මතය

------

ව්‍යාපෘතියේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

--------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තව දුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම

------------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම සම්බන්ධ වගකීම, පාලනය හා සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---------------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම, උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනා ගැනීමේදී හා තක්සේරු කිරීමේදී, අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇති වීමට හේතු වේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය හා කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාව අගයන ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

### 2.1 නීතිරීති රෙගුලාසි වලට අනුකූල නොවීම

| නීතිරීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම | බලපෑම | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
| --- | --- | --- | --- | --- |
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 371(5) සහ 2015 ජූලි 14 දිනැති අංක 03/2015 දරන රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛය | උපරිම අනුමත සීමාව වූ රු.100,000 ඉක්මවා අවස්ථා 31 කදී එකතුව රු.මිලියන 8.74 ක තත්කාර්ය අතුරු අග්‍රිම නිලධාරින්ට නිකුත් කර තිබුණි. තවද අවස්ථා දෙකකදී නිකුත් කර තිබුණු තත්කාර්ය අතුරු අග්‍රිම එකතුව රු.175,000 ක් අදාළ අවශ්‍යතාවය ඉටු කර ගැනීම සඳහා උපයෝජනය නොකර දින 46 සිට දින 87 දක්වා ප්‍රමාදයකින් පසුව නිරවුල් කර තිබුණි. එකතුව රු.මිලියන 2.16 ක සමස්ථ අතුරු අග්‍රිම ශේෂයම අදාළ අවශ්‍යතාවය සඳහා උපයෝජනය නොකර පසුව පියවා තිබුණි. | පාලන දූර්වලතා හේතුවෙන් අරමුදල් අවභාවිතයන් විය හැකිවීම. | අදහස් දක්වා නැත. | උපරිම සීමාව ඉක්මවා අත්තිකාරම් සැපයීමට මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කළ යුතු අතර අපේක්ෂිත අරමුණ සඳහා මුදල් භාවිතා කිරීමෙන් පසු වහාම පියවිය යුතුය. |

## 3. භෞතික කාර්යසාධනය

### 3.1 ව්‍යාපෘති කාර්යයන්හි භෞතික ප්‍රගතිය

| විගණන නිරීක්ෂණය | බලපෑම | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
| --- | --- | --- | --- |
| ඒඩ්ස් මර්ධනය කිරීම සඳහා වූ ගෝලීය අරමුදල් ව්‍යාපෘතියේ නව මූල්‍යායන ආකෘතිය යටතේ එච්අයිවී/ඒඩ්ස් සංරචකයේ යාවත්කාලීන කරන ලද ප්‍රගතිය පිළිබඳ සටහන් සහ වියපැහැදම් ඉල්ලීම් අනුව, සමාලෝචිත වර්ෂය තුළදී ක්‍රියාකාරකම් 51 සඳහා රු.මිලියන 129.79 ක් වැය කර තිබුණි. කෙසේ වුවද, ඇස්තමේන්තු පිරිවැය රු.මිලියන 2.16 | සැලසුම් කරන ලද ක්‍රියාකාරම් සම්පූර්ණ කිරීමකින් තොරව මුදල් ඉතිරි කිරීම. | අදහස් දක්වා නැත. | ප්‍රතිපාදන උපයෝජනය කිරීමට හා මූල්‍ය පාලනය ශක්තිමත් කිරීමට කටයුතු කළ යුතුය. |

කට සමාන එක්සත් ජනපද ඩොලර් 13,302 කට ක්‍රියාත්මක කිරීමට සැලසුම් කරන ලද සමාලෝචිත වර්ෂය අවසන් වන විට අවසන් කළ යුතු ක්‍රියාකාරකම් 7 ක් 2018 දෙසැම්බර් 31 දින වන විටත් සම්පූර්ණ කර නොතිබුණි. අයවැය ක්‍රියාකාරකම් 30 ක් යටතේ රු.මිලියන 72.31 කට සමාන එක්සත් ජනපද ඩොලර් 444,870 ක් ප්‍රතිපාදනය කර තිබුණු අතර ඉන් සමාලෝචිත වර්ෂය තුළ දී රු.මිලියන 28.19 කට සමාන එක්සත් ජනපද ඩොලර් 173,416 ක් පමණක් උපයෝජනය කර තිබුණු බව නිරීක්ෂණය විය. එසේම අයවැයගත ක්‍රියාකාරකම් 21 යටතේ වෙන් කරන ලද රු.මිලියන 25.01 කට සමාන එක්සත් ජනපද ඩොලර් 153,880 ක ප්‍රතිපාදනය ඉක්මවා රු.මිලියන 51.52 කට සමාන එක්සත් ජනපද ඩොලර් 316,990 ක් ව්‍යාපෘතිය විසින් වැය කර තිබුණි.

**3.2 උපයෝජනය නොකළ සම්පත්**

| විගණන නිරීක්ෂණය | බලපෑම | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
| --- | --- | --- | --- |
| උතුරු හා නැගෙනහිර පළාතේ ලිංගික සෞඛ්‍ය සේවාව වැඩිදියුණු කිරීම සඳහා එම පළාතේ මූලික රෝහල් 9 කට සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 4.7 ක් වූ සෞඛ්‍ය නොවන උපකරණ ප්‍රසම්පාදනය කර තිබුණු අතර ඉන් උපකරණ අයිතම 44 ක් වෙනත් පළාත් 6 ක රෝහල් සඳහා බෙදාහැර තිබුණි. | අපේක්ෂිත අරමුණු ඉටු නොකිරීම. | අදහස් දක්වා නැත. | හේතු පරීක්ෂා කිරීමට කටයුතු කළ යුතුය. |

**3.3 මතභේදයට තුඩුදෙන ගණුදෙනු**

**පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.**

| විගණන නිරීක්ෂණය | | බලපෑම | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
| --- | --- | --- | --- | --- |
| (අ) | ඒඩ්ස් මර්දනය කිරීම සඳහා වූ ගෝලීය අරමුදල් ව්‍යාපෘතියේ නව මූලායන ආකෘතිය යටතේ එච්අයිවී/ඒඩ්ස් සංරචකයේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මත වරලත් ගණකාධිකාරී | නීති හා රෙගුලාසි අනුගමනය කිරීමට අසමත් වීම. | අදහස් දක්වා නැත. | විගණකාධිපතිගේ එකඟතාවය ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | සමාගමක් විසින් සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය වෙත වෙනම විගණන වාර්තාවක් නිකුත් කර තිබුණු අතර එමඟින් තත්වාගණනය නොකළ විගණන මතයක් ප්‍රකාශ කර තිබුණි. කෙසේ වෙතත් ඒ සඳහා විගණකාධිපතිගේ එකඟතාවය විමසා නොතිබුණි. | | | |
| (ආ) | ලද තොරතුරු අනුව, පසුගිය වර්ෂවල ශ්‍රී ලංකාවේ එච්අයිවී/ඒඩ්ස් රෝගීන් ක්‍රමයෙන් වැඩි වී තිබුණි. එච්අයිවී/ඒඩ්ස් පාලන වැඩසටහන් අනුව, 2016 දෙසැම්බර් 31 දිනට 2557 ක් වූ එච්අයිවී/ඒඩ්ස් රෝගීන් සංඛ්‍යාවට සාපේක්ෂව සමාලෝචිත වර්ෂය අවසාන වන විට එච්අයිවී/ඒඩ්ස් රෝගීන් 3192 වාර්තා විය. තවද, බස්නාහිර පළාතේ ජනාකීර්ණ ප්‍රදේශවල රෝගීන් 1723 ක් ජීවත් වන අතර එහි ප්‍රතිඵලයක් වශයෙන් අවදානම සහිත කණ්ඩායම් අතර රෝගය පැතිරීමට ඇති ඉඩකඩ විගණනයේදී බැහැර කළ නොහැක. | රෝගය පැතිරීමේ සමාජ බලපෑම් මැනිය නොහැකි වීම හා ආරක්ෂිත ක්‍රියාකාරකම් ඵලදායි ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය වීම. | අදහස් පළකර නැත. | නවීන යාන්ත්‍රණයක් සමාලෝචනය කිරීමට හා සංවර්ධනය කිරීමට සහ අවදානම් සහිත කණ්ඩායම් දැනුවත් කිරීමට පියවර ගත යුතුය. |

**3.4 පද්ධති සහ පාලන**

| | විගණන නිරීක්ෂණය | බලපෑම | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | මුදල් රෙගුලාසි 133 ප්‍රකාරව, සමාලෝචිත වර්ෂයේ ව්‍යාපෘති ගනුදෙනු සම්බන්ධයෙන් සෞඛ්‍ය පෝෂණ හා දේශිය වෛද්‍ය අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශය විසින් විගණනයක් සිදුකර නොතිබුණි. | දුර්වල මූල්‍ය පාලනය. | අදහස් ඉදිරිපත් කර නැත. | අභ්‍යන්තර විගණනයක් ක්‍රියාත්මක කළ යුතුය. |
| (ආ) | 2008 වර්ෂයේ සිට ව්‍යාපෘතිය වෙනුවෙන් මිලදී ගෙන තිබුණු පිරිවැය රු.මිලියන 112.59 කට සමාන එක්සත් ජනපද ඩොලර් 744.103 ක වත්කම් සම්බන්ධයෙන් 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා භෞතික සත්‍යාපනයක් සිදුකර නොතිබුණි. | වත්කම්වල භෞතික පැවැත්ම මැනිය නොහැකි වීම. | අදහස් ඉදිරිපත් කර නැත. | ව්‍යාපෘතියේ වත්කම් භෞතික පරීක්ෂාවට කටයුතු කළ යුතුය. |